එන්. ටී ගමගේ

ශ්‍රී ලංකාවේ ඇති සියලු ම ජාතික වනෝද්‍යානවල කඳවුරු බිම් සංචාරකයන් සඳහා වෙන්කර දීම වගකීම දරන්නේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යි.

කෑම්පින් (Camping) මෙය පොදුවේ ගත් කළ බහුතර සාමාන්‍ය ජනතාවට න මී ආගන්තුක වචනයකි. එහෙත් ඕනෑම රටක වෙසෙන ස්වභාවික පරිසරයට ඇලුම් කරන, වනය, ඇලදොළ සතා සිව්පාවා සමඟ ගැවසීමට කැමැත්තක් දක්වන පිරිස්වලට නම් මෙය ඉතාම හුරුපුරුදු වචනයකි. අත්දැකීමකි. ඇත්තෙන් ම කෑම්පින් යනු සරළව ම කිවහොත් කුඩාරමක කාලය ගත කිරීමයි. සාමාන්‍යයෙන් මේ අපේ එදිනෙදා ජීවිතයේ දී කුඩාරම් භාවිතයක් සිදු කරන්නේ නැත. එසේ නම් කුඩාරම් භාවිතයක් හෙවත් Camping අවශ්‍ය වන්නේ කොතැනක දී ද?

කෑම්පින් ජනප්‍රියව ඇත්තේ සංචාරක ව්‍යාපාරයත් සමඟිනි. විශේෂයෙන් ම වනෝද්‍යානවල සංචාරය කරමින් ගස්වැල්, සතුන් නරඹා වින්දනයක් ලැබීමට කැමති සංචාරකයන් අතර කෑම්පින් ඉතා ජනප්‍රියව ඇත. ඊට ප්‍රධානම හේතුව ඒ ඇත්තේ වනයේ ම දිවා රෑ කිහිපයක් රැඳී සිටිමින් වනයට ඉතා ම ආසන්නව අත්දැකීම් විඳීමට උපරිමයෙන් ම හැකියාවක් කෑම්පින් හරහා ලැබෙන බැවිනි.

කෑම්පින් යනු හුදෙක් වනයක් තුළ කුඩාරමක් ඉදිකර එහි රැයක් ගත කිරීමක් පමණක් ම නොවේ. ඉන් ඔබ්බට ගිය කටයුතු රාශියක් ම කෑම්පින් නැමැති ක්‍රියාවලියට අයැදැස්ත යි. අපි මෙය අපට වඩාත් ම ආසන්න අපගේ ම මව් රටේ ජාතික වනෝද්‍යාන සහ අපට ඔබ්බන අත්දැකීම් සමඟ සාකච්ඡා කර බලමු.

ලෝකයේ බොහෝ රටවල මේ වන ඊවත් කෑම්පින් බොහෝ ජනප්‍රියව පැවතුනත් මෙය ශ්‍රී ලංකාව තුළ තවමත් හිස ඔසවන මව්ටමක පවතින්නකි. ඊට හේතුව ඒ ඇත්තේ දේශීය සංචාරකයන් තුළ මේ පිළිබඳ වීතරම් අවබෝධයක් නොපැවතීමයි. කෑම්පින් යනු සැබැවින් ම දිනක් හෝ දින කිහිපයක් කුඩාරමක රැඳී සිටිමින් ස්වභාවික පරිසරය සමඟ සහයෝගයෙන් කරන්නා වූ ගනුදෙනුවකි. බැලූ බැල්මට ම හරිත වැස්මකින් වැසුණු ශ්‍රී ලංකාවේ කෑම්පින් සඳහා තෝරාගත හැකි ජාතික වනෝද්‍යාන සහ අතය භූමි ගණනාවක් ම තිබේ. මේවා අතුරින් දෙස් විදෙස් සංචාරකයන් අතර වඩාත් ම ප්‍රචලිතව ඇත්තේ යාල ජාතික වනෝද්‍යානයයි. ඊට හේතු වී ඇත්තේ යාල ජාතික වනෝද්‍යානයේ කඳවුරු බිම්වල රැඳී සිටිමින් වඩාත් වනසතුන්ට ලංව කෑම්පින්හි උපරිම තෘප්තිය ලබාගත හැකි වීමයි. යාල ජාතික වනෝද්‍යානයේ ඇති ජඹුරාගල, බුතව ආදී කඳවුරු බිම්වල රැයක් හෝ රෑ කීපයක් කුඩාරමක රැඳී සිටීම අලි වලසුන්, දිවියන්, මුවන් වල් උරුන් ආදී සතුන්ට ඉතාම ලංව විඳිය හැකි අත්දැකීමක් වන අතර පක්ෂි නිරීක්ෂකයන්ට ද එය ඉතා ම තෘප්තිමත් අත්දැකීමකි.

යාලට අමතරව ශ්‍රී ලංකාවේ කෑම්පින් සඳහා ප්‍රචලිතව ඇති වනෝද්‍යානය කිහිපයක් වන්නේ වස්ගමුව, උඩවලව සහ හෝර්ටන් තැන්න හෙවත් මහවිලියයි. මේවා අතරින් වස්ගමුව සහ උඩවලව කුඩාරම් අත්දැකීම් යාලට බොහෝ සෙයින් සමාන වේ. ඊට හේතුව මෙම ජාතික වනෝද්‍යාන දෙක තුළ පවතින්නේ ද යාලට බොහෝ සෙයින් සමාන දේශගුණික ලක්ෂණයන් වීමයි. එසේ ම වනසතුන් සමඟ ලබාගත හැකි අත්දැකීම් ද බොහෝ සෙයින් සමාන ය. එහෙත්, හෝර්ටන් තැන්න හෙවත් මහවිලිය ජාතික වනෝද්‍යානයේ කඳවුරු බිම්ක කුඩාරමක් තුළ රැය කිහිපයක් පහන් කිරීම යනු ඊට හාත්පසින් ම වෙනස් වූ අත්දැකීමකි. ඊට හේතුව හෝර්ටන් තැන්න ශ්‍රී ලංකාවේ මධ්‍ය කඳුකරයේ හඳවන බඳු ස්ථානයක පිහිටා තිබීමය. දෙසැම්බරයට හිම මීදෙන දේශගුණික රටාවක් පවතින හෝර්ටන් තැන්නේ ජීවත්වන සත්ව විශේෂයන් ද ඊටම බොහෝ සෙයින් ආවේණික ය. හෝර්ටන් තැන්නේ කඳවුරු බිම්ක රැඳෙන සංචාරකයන්ට ඉතාම පහසුවෙන් සුවිසල් ගෝනුන් දැකබලා ගැනීමේ දුර්ලභ අත්ස්ථාව හිමි වේ. සඳ පහන් වී ඇති රැයක ඔබට වාසනාව තිබේ නම් කලාතුරකින් දැකිය හැකි දිවියකු ද හෝර්ටන් තැන්නේ දී දැකබලා ගත හැකි ය. ඊට අමතර හෝර්ටන් තැන්න පක්ෂි නිරීක්ෂකයන්ගේ ද පාරාදීසයකි. ශ්‍රී ලංකාවට ආවේණික Aranga සහ White-eye වැනි දුර්ලභ පක්ෂීන් නැරඹීම සඳහා කුඩාරමක දිනක් හෝ දෙකක් රැඳී සිටීම අත්‍යවශ්‍ය කරුණක් වේ. ඊට අමතරව සුන්දර අග්‍රා ඔයේ සිසිල් ජලයේ පහස විඳීමටත්, ප්‍රධාන මාර්ගයට ඔබ්බෙන් පිපෙන දුර්ලභ මහරත් මලක් දැක ගැනීමටත් තරමක් දුෂ්කර ගමනකින් පසුව කිරිගල් පොත්ත සහ තොටුපොළ කඳු තරණය කිරීමටත් හැකි වන්නේ කුඩාරමක රැඳෙන අපූරු අත්දැකීම වෙහොත් ම පමණකි. (සංචාරක බංගලාවල රැඳී සිටිමින් මෙම අත්දැකීම් විඳීම වීතරම් පහසු නැත)

කෑම්පින් සඳහා උනන්දුවක් දක්වන දේශීය හා විදේශීය සංචාරකයන් සබඳතා පවත්වා ගත යුතු වැදගත් ම ආයතනයක් වන්නේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවයි. ඊට හේතුව වන්නේ ශ්‍රී ලංකාවේ ඇති සියලු ම ජාතික වනෝද්‍යානවල කඳවුරු බිම් සංචාරකයන් සඳහා වෙන්කර දීම වගකීම දරන්නේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වීමයි. එසේ ම සංචාරකයන්ට වනෝද්‍යාන පිළිබඳ අවශ්‍ය කරන සියලු ම තොරතුරු සැපයීම සිදු කෙරෙන්නේ ද මෙම දෙපාර්තමේන්තුව විසිනි. සංචාරකයකුට යම් වනෝද්‍යානයක කඳවුරු බිමක් වෙන්කර ගැනීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා අවම තරමේන් මසකට (දින 30 කට) ප්‍රථම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු ය. එහි දී ඉතාම සුළු මුදලකට එම කටයුත්ත ඉටු කරවා ගැනීමට හැකියාව ලැබේ. දැන් අපි කෑම්පින් හි අත්‍යවශ්‍ය අංගයන් මොනවා දැයි විමසා බලමු.

කෑම්පින් සඳහා අවශ්‍ය වන්නාවූ මූලික ම දෙය වන්නේ ස්වභාව ධර්මයට ඇළුම් කරන මනසක් තිබීමයි. ස්වභාවධර්මය පිළිබඳව ඇළුණු මනසක් නැති කිසිවකුටත් කෑම්පින් හෙවත් ස්වභාවධර්මය සමඟ කරන මෙම ගනුදෙනුව කිසියාකාරයෙන් සිදුකළ නොහැකි ය. එසේ ම කෑම්පින් සඳහා උනන්දු වන්නකු ප්‍රථමයෙන් ම ඉටු කළ යුතු තවත් අවශ්‍යතාවක් වන්නේ, කෑම්පින් පිළිබඳ අත්දැකීම් ඇති පරිසර ලෝලීන්ගෙන් ඒ පිළිබඳ මූලික උපදෙස් ලබා ගැනීමයි. මන්ද කොතරම් පෙර උපදෙස් ලබා තිබුණ ද කෑම්පින් පිළිබඳ අත්දැකීම් සහිත අයකුගෙන් ලබා ගන්නා උපදෙස් හදිසි අවස්ථාවල දී අතිශයින් ම වැදගත් වන බැවිනි.

කෑම්පින් හෙවත් කඳවුරු ජීවිතය සඳහා අවශ්‍ය වන්නා වූ ප්‍රධාන සාධකයක් වන්නේ මෝටර් රථයකි. කෑම්පින් සඳහා වඩාත් ම සුදුසු වන්නේ ෆෝවීල් වර්ගයේ ජීප් රථයකි. මූලික වශයෙන් ම අදාළ වනගත පරිසරයට ප්‍රාප්‍ය වීමට මෝටර් රථයක් වැදගත් වන අතර වනයේ රැඳී සිටීමේ දී වනගත මාර්ග ඔස්සේ ගමන් කිරීමට ෆෝවීල් වාහනයක් දැඩිසේ අවශ්‍ය වේ. මන්ද වනගත මාර්ග බොහෝ සෙයින් ම කඩතොළු සහ මඩවගුරු සහිත ව පවතින බැවිනි. යාල වැනි ජාතික වනෝද්‍යානවල දී නොගැඹුරු ජලාශ ඔස්සේ ද ගමන් කිරීමට සිදුවන බැවින් ෆෝවීල් වාහනයක් අත්‍යවශ්‍ය ම සාධකයක් බවට පත්වේ. මෙහි දී මෝටර් රථයක් භාවිතා කරන්නන් හමුවේ මතුවන තවත් අභියෝගයක් වන්නේ එක් මෝටර් රථයක් ප්‍රමාණවත් නොවීමයි. මන්ද යම් හෙයකින් එක් මෝටර් රථයක් මඩ වගුරක වරුණහොත් නොවසේ නම් වනය මැද කාර්මික දේශයකට ලක්වුවහොත් එහි සහයට තවත් ෆෝවීල් රථයක් අනිවාර්යයෙන් ම අවශ්‍ය වන බැවිනි (මෙමඟින් මෝටර් රථයක් නොමැති අයකුට කෑම්පින් හා සැබෑ අත්දැකීම් විඳ ගැනීමට අවස්ථාවක් නැතැයි අදහස් වන්නන් නැත) මෝටර් රථයක් නොමැතිව කෑම්පින් කිරීම වඩා අවදානම්, එසේම වඩාත් දුෂ්කර, තෘප්තිකර අත්දැකීමක් ආවරණය වන පරිදි සංචාරය කිරීමට අවස්ථාවක් නොලැබීමයි.

කඳවුරු බිමක දින කිහිපයක් ගත කිරීමේ දී අවශ්‍ය වන්නා වූ දෑ රැසකි. ඉන් පළමුවැන්න වන්නේ ආහාරයි. කඳවුරු බිමකට ඔබ හිවසේ දී එදිනෙදා සකසා ගන්නා ආහාර සුදුසු වන්නේ නැත. කඳවුරු බිමක් සඳහා වඩාත් සුදුසු වන්නේ සහජැල්ලුවෙන් රැගෙන යා හැකි ඉක්මණින් පිළියෙල කරගත හැකි ආහාරයි.

විශේෂයෙන්ම නූඩ්ල්ස්, කඩල, කව්පි වැනි ආහාර දවසේ වීලකට සුදුසු වේ. ඊට අමතරව ටින් මාළු සහ පහසුවෙන් සකසා ගත හැකි ටින් කළ ආහාර වඩාත් සුදුසු වෙයි. ප්‍රධාන ආහාර වේල් අතරතුර සංචාරය සඳහා ශක්තිය රඳවා ගැනීමට බිස්කට් වැනි වීයළි ආහාර වඩාත් ප්‍රයෝජනවත් වන අතර පා ගමනින් කෙරෙන දුෂ්කර චාරිකාවල දී රට ඉඳි සහ ගැලකෝස් ශක්ති ජනක ආහාර ලෙස වඩාත් වැදගත් වේ. කඳවුරු බිමක් වෙත ආහාර රැගෙන යාමේ දී මූලික අවධානය යොමු කළ යුතු කරුණ වන්නේ ආරක්ෂා සහිතව ඒවා රැගෙන යාමයි. විශේෂයෙන් ම වර්ෂාවෙන් සහ රිලවු, වසුරන් සහ කෘමි සතුන්ගෙන් ආරක්ෂා වන පරිදි ආහාර අසුරා ගැනීම මූලික අවශ්‍යතාවකි.

කඳවුරු බිමක් සඳහා අවශ්‍ය වන අනෙක් ප්‍රධාන ම සාධකය වන්නේ කූඩාරමයි. කූඩාරමක් නොමැති තැන එය කඳවුරු බිමක් වන්නේ නැත. කෑම්පින් සඳහා අවශ්‍ය කූඩාරම් ප්‍රධාන නගරවලින් මිලදී ගැනීමේ හැකියාව පවතින අතර සංචාරයට සහභාගි වන සංඛ්‍යාව අනුව කූඩාරමේ විශාලත්වය තීරණය කිරීම ද වැදගත් වේ. සිව් දෙනෙකුගෙන් පමණ සමන්විත කණ්ඩායමකට අඩි 10x6 ප්‍රමාණයේ කූඩාරමක් අවශ්‍ය වන අතර කිසිදු අවස්ථාවක පෙර සූදානමකින් තොරව කූඩාරමක් නිර්මාණය කොළඹ යුතු ය. විශේෂයෙන්ම සිහි තබා ගත යුතු කරුණක් වන්නේ ඔබ රැගෙන යන ගමන්මළු, බඩුබාහිරාදිය ආරක්ෂා සහිතව තැබීමට කූඩාරම ප්‍රමාණවත් සහ සුදුසු වීමයි. එසේම, කූඩාරම් රෙද්දෙන් ජලය කාන්දු නොවන බවට ද බිම වලන ඇතිරිල්ල (ධරදමබා"යැවළ) යෝග්‍ය බවට ද තහවුරු කර ගැනීම වැදගත් වේ. එසේම එය වර්ෂාවක් හෝ වෙනත් හදිසි අවස්ථාවක දී ඉක්මණින් (විනාඩි 05ක් ඇතුළත) නිර්මාණය කරගත හැකි කූඩාරමක් විම ද අත්‍යවශ්‍ය වේ. මෙහි දී ඔබ කූඩාරම ඉදිකරන බිම පිළිබඳ සැළකිලිමත් විය යුතු ය. කූඩාරම ඉදි කිරීම සඳහා තැනිතලා බිමක් තෝරාගත යුතු අතර, යම් හෙයකින් තෝරාගත් බිම බෑවුම් සහිත එකක් නම් කූඩාරමේ දොරටුව ජලය ඇතුළට ගලා නොවන සේ බෑවුමේ පහළ දිශාවට යොමුවන ආකාරයෙන් ඉදිකරගත යුතු ය.

කෑම්පින් සඳහා සූදානම් වන අයකු විසින් අවධානය යොමු කළ යුතු තවත් ප්‍රධාන ම සාධකයක් වන්නේ ගමන් මල්ලයි. ඕනෑම අවස්ථාවක තමා විසින් රැගෙන යා යුතු භාණ්ඩ ප්‍රමාණය වෙනස් විය හැකි නිසා (එක් සාමාජිකයකුට අනතුරක් හෝ ආබාධයක් ඇතිවුවහොත්) අවශ්‍ය තරමේ විශාලත්වයක් ගමන් මල්ලේ තිබිය යුතු ය. අනෙක් කරුණ නම් ගමන් මල්ල ජලයට ඔරොත්තු දෙන එකක් වීමයි. මෙවන් සංචාරවල දී බොහෝ විට වර්ෂාව මුහුණ දීමටත් ජලාශවලින් එතරා වීමටත් සිදුවන නිසා ජලයට ඔරොත්තු දෙන ගමන් මල්ලක් තිබීම තම ඇඳුම් හා අනෙකුත් ආමිසන්න ආරක්ෂා කර ගැනීමට වඩාත් ඉවහල් වේ.

කෑම්පින් සඳහා භාවිතා කෙරෙන ඇඳුම් ද සාමාන්‍ය සංචාරයක් සඳහා තෝරා ගන්නා ඇඳුම්වලට වඩා වෙනස් ය. වනගත සංචාරවල දී විශේෂයෙන් ම වනසතුන් හොඳින් නැරඹීමට වඩාත් සුදුසු වන්නේ කාකි පැහැති එසේත් නොමැති නම් අඳුරු පැහැති ඇඳුම් ය. සුදු හෝ දීප්තිමත් පැහැ ඇඳුම් නිසා සතුන් බියවීමට ඉඩ ඇති නිසා අඳුරු පැහැ ඇඳුම් ඔබේ සහ සතුන්ගේ ආරක්ෂාවට වඩාත් යෝග්‍ය වේ. දින කිහිපයක සංචාරයක් වුව ද හැකි තරම් අඩුවෙන් ඇඳුම් රැගෙන යාම ඔබේ පහසුවට ඉවහල් වේ. ඇඳුම් අතරට වර්ෂාවට මෙන්ම අතු ඉති වැදී සිදුවන ඉරේම්වලට ද ඔරොත්තු දෙන හිස් වැස්මක් ද වර්ෂාවක දී නොතෙමී සිටීමට වැහි කබායක් ද දුෂ්කර ගමන් සඳහා සුදුසු පාවහන් යුවළක් ද, මේස් කූට්ටම් කිහිපයක් ද කෑම්පින් සඳහා එක්කර ගත යුතු ය.

කෑම්පින් හි දී ඔබ රැගෙන යන ආහාර පහසුවෙන් පිසගැනීමට අවශ්‍ය උපකරණ කෙරෙහි ද වැඩි අවධානයක් යොමු කළ යුතු ය. ආහාර පිසීම සඳහා අවශ්‍ය පහසුම මාධ්‍ය වන්නේ වනයෙන් ලබාගත හැකි වීයළි දැව ය. එහෙත් වර්ෂා කාලයක දී වීයළි දැව උපයෝගී කරගත නොහැකි නිසා කුඩා ගෑස් සිලින්ඩරයකත් වතරම් මිල නොවන කුඩා ගෑස් උඳුනකත් සතය ලබාගත හැකි ය. ආහාර සකස් කිරීම සඳහා ඇලුමිනියම් බඳුන් 02 ක් ප්‍රමාණවත් වන අතර, තේ හෝ කෝපි සඳහා තවත් එක් ඇලුමිනියම් බඳුනක් රැගෙන යා යුතු ය. ඊට ගැලපෙන ආකාරයෙන් හැඳි 2 ක් හෝ 3 ක් රැගෙන යා හැකි ය. එසේම, පෙරණයක්, තේ හෝ කෝපි සාදා ගැනීමට ප්ලාස්ටික් කෝප්පයක් රැගෙන යා යුතු ය. ආහාර ගැනීමේ දී ප්ලාස්ටික් පිඟන් සහ ප්ලාස්ටික් කෝප්ප වඩාත් ප්‍රයෝජනවත් වන්නේ නොබිඳීමේ හා පිරිසිදු කිරීමේ පහසුව යන කරුණු නිසා ය.

කෑම්පින් සඳහා සූදානම් වීමේ දී රැගෙන යා යුතු තවත් උපකරණ රැසක් ඇත. ඒ අතුරින් රාත්‍රියේ දී ආලෝකය ලබා ගැනීම සඳහා තුම්මතල් ලාන්තෑරුම් සහ ඉලිපන්ඩ්මේ වැදගත් වේ. ගින් දල්වා ගැනීම සඳහා ගිනි පෙට්ටිවලට වඩා සුදුසු වන්නේ ජලයට ඔරොත්තු දෙන ලයිටරයක් ය. එසේ ම සංචාරය අතරතුර ජලය රැගෙන යාමට සිදුවන නිසා ගමන් මල්ලේ රඳවාගත හැකි ප්ලාස්ටික් හෝ ඇලුමිනියම් වතුර බෝතලයක් අවශ්‍ය වේ. කූඩාරම් බිමේ දී මෙන්ම සංචාරය අතරතුර දී ද කුඩැල්ලන්ගෙන් ආරක්ෂා වීමට සිදුවීය හැකි නිසා තෙත් කලාපීය වනාන්තරවල සංචාරය කිරීමේ දී සබන් හෝ ලුණු රැගෙන යාම අවශ්‍ය වේ. එසේම, කුඩලු ප්‍රහාරය සහ සිදුවිය හැකි තවත් සුළු තුවාල වෙනුවෙන් නිරන්තරයෙන් ම ප්‍රථමාධාර කට්ටලයක් සහ වේදනා නාශක ඖෂධ ඔබේ ගමන් මල්ලේ තිබිය යුතු ය. ඊට අමතරව ඔබේ සංචාරය අතරතුර පක්ෂීන් හා අනෙක් වනසතුන් පිළිබඳව වන වැඩි